දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2013 පරීක්ෂණය - 2015 මැයි/ජූනි
First Examiition in Arts (External) 2013 – May/June 2015

ඉප්‍ර 1.1 - ශ්‍රී ලංකාවේ ඉතිහාසය (ආරම්භයේ සිට ක්‍රි.ව. 1500 දක්වා)
HY 1.1 – History of Sri Lanka (From the beginning to 1500 AD)

**කාලය පැය තුන යි**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**
**නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ**

---

01. පැරණි ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැඩගැස්වීමෙහි ලා එරට භූගෝලීය පිහිටීම ඉවහල් වූ ආකාරය පරීක්ෂා කරන්න.

02. කාවන්තිස්ස හා දුට්ඨගාමණී රජවරුන්ගේ දේශපාලන කාර්ය සංසිද්ධීන්හි සමාන අසමානතා පහත දැක්වෙන මාතෘකා යටතේ විමසුමට ලක් කරන්න.
   I. ඔවුන් මුහුණ පෑ අභියෝග
   II. දිවයින එක්සත් කිරීම

03. අනුරාධපුර රාජධානි සමයෙහි අවසානය දක්වා දිවයිනට එල්ල වූ දකුණු ඉන්දීය ආක්‍රමණ විචාරාත්මකව විමසන්න.

04. අනුරාධපුර යුගයේ දී රජු හා සංඝයා අතර පැවති අන්තර් සබඳතාව මූලාශ්‍ර ඇසුරෙන් සාකච්ඡා කරන්න.

05. පළමුවන විජයබාහු රජුගේ කාර්ය සාඵල්‍යයෙහි වැදගත්කම පහත දැක්වෙන මාතෘකා ඇසුරෙන් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.
   I. ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම
   II. ආගමික කටයුතු
   III. විදේශ ප්‍රතිපත්තිය

06. "පොළොන්නරු රාජධානයේ බිඳ වැටීමට එම රාජධානියේ සමෘද්ධිමත්ම පාලකයා වූ මහා පරාක්‍රමබාහු රජුගේ ඇතැම් ක්‍රියා මාර්ග හේතුවීය." ඔබ ඉහත ප්‍රකාශයට එකඟවන්නේ දැයි සහේතුකව පරීක්ෂා කරන්න.

07. පොළොන්නරු යුගය සහ පශ්චාත් පොළොන්නරු යුගය සම්බන්ධ පහත දක්වෙන මාතෘකා යටතේ ඕනෑම දෙකකට (02) ඓතිහාසික සටහන් ලියන්න.

I. පොළොන්නරු යුගයේ වාරිමාර්ග ක්‍රමය
II. නිශ්ශංකමල්ල රජුට මුහුණ දීමට සිදුවූ අභියෝග
III. පොළොන්නරු යුගයේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
IV. පශ්චාත් පොළොන්නරු යුගයේ වෙළඳ හා වාණිජ කටයුතු
V. ගම්පොල අවධියේ ගෘහ නිර්මාණ ශිල්පය

08. <u>එක්කෝ</u>

දෙවන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සංසිද්ධීන් සැකෙවින් සාකච්ඡා කරන්න.

<u>නැත්නම්</u>

කෝට්ටේ යුගයේ අධ්‍යාපනික හා සාහිත්‍යයික කටයුතු අළලා ඓතිහාසික රචනයක් ලියන්න.

********************************